කිතුල් ගස් මැදීම සඳහා විකිණීමේ බලපත්‍ර සම්බන්ධව ප්‍රතිරූප ගිවිසුම

.....(ලිපිනය)

..... (සම්පූර්ණ නම) වන මා සුරාබදු කොමසාරිස් ජනරාල් හෝ බලයලත් නිලධාරියෙකු වන .....

(තනතුර).....(සම්පූර්ණ නම) ඉදිරිපිට පහත සඳහන් කොන්දේසි පිළිගනිමින් හා එම කොන්දේසිවලට එකඟ වන බවත් කියවා බලා තේරුම් ගත් බවත් පහත අත්සන් තබමින් සහතික වෙමි.

කොන්දේසි

01.සුරාබදු දෙපාර්තමේන්තුවේ බලපවත්වන සියලු කොන්දේසිවලට එකඟවීමටත්

02.බලපත්‍රධාරියාටම කිතුල් ගස් මැදීම හා රා විකිණීම කළහැකි අතර ඒ සඳහා බලපත්‍ර යේ මදින්නා/ වාහකයා යෙදිය යුතුය.

03.බලපත්‍ර යේ නම සඳහන් මදින්නා නොමැතිව වෙනත් මදින්නකු සේවයේ යොදවන්නේ නම් බලපත්‍රධාරී විසින් ම මදින්නාගේ නම/ වාහකයාගේ නම, ලිපිනය බලපත්‍ර යේ වම් පැත්තේ මදත් දිනයේ සිට ලියා දින දමා අත්සන් කොට තමාට ලියන්න නොහැකි නම් තමා වෙනුවෙන් වෙන කෙනෙකු ලවා එසේ ලියවා දින දමා අත්සන් කරවා ගෙන මිසක හෝ වෙන මදින්නකු/ වාහකයෙකු යොදවා නොගත යුතුය.

04.අංක 03 සඳහන් පරිදි වෙනත් මදින්නකු/ වාහකයකු යොදවා ගත හැක්කේ

(1) දින පහළොවකට වැඩි කාලයක් හෝ

(2) තාවකාලිකව මදින්නා/ වාහකයා බලයලත් නිලධාරියෙකු විසින් ඉවත් කිරීමට නිවේදන ලබා දුන් විට පමණි

05.මදින ලද කිතුල් රා සුරාබදු නිවේදනයේ හා අදාළ අනෙකුත් නිවේදනවල හා නියෝගවලට යටත්ව හැර විකිණීම හෝ තෑගි කිරීම තහනම්ය.

06.කිසිම කිතුල් ගසක් අපර භාග 05ට පසු හෝ පූර්ව භාග 05ක් අතර නොමැදිය යුතු අතර කිතුල් රා විකිණීමට ද පූර්ව භාග 10.00 සිට අපර භාග 08.00 වන තෙක් පමණක් සිදුකල යුතුය.

07.සුරාබදු කොමසාරිස් ජනරාල්වරයාට නියමිත වේලාවන් වෙනුවට අභිමතය පරිදි වෙනයම් වේලාවන් නියම කළ හැකිය.

08.මදින ලද කිතුල් රා වලට කිසිම ද්‍රව්‍යක් මිශ්‍ර කිරීම හෝ එම රා වෙන අන්දමකින් බාල කිරීම හෝ කෘතිම රා සකස් කිරීම හෝ විකිණීම නොකළ යුතුය.

09.රා විකිණීම/ ප්‍රවාහනය සඳහා යොදා ගන්නා සියලුම භාජන ඉකාමත් පිරිසිදුව තබා ගත යුතුය.

10.ගස් ලකුණු කිරීමට පෙර මැදීම නොකළ යුතුය.

11.යම්කිසි හේතුවක් නිසා හෝ ගස් මැදීම නොකරන්නේ නම් සියලුම බලපත්‍ර අදාළ ප්‍රදේශයේ සුරාබදු ස්ථානාධිපතිට භාරදිය යුතු අතර නැවත මැදීම පටන් ගත්විට බලපත්‍රය ලබා ගත යුතුය.

12.කිතුල් රා පරීක්ෂා කිරීමට සුරාබදු නිලධාරියෙකු ඉල්ලා සිටි විට එල්ලා තිබෙන මුට්ටි පරීක්ෂා කිරීම පිණිස බා දීමටත් පරීක්ෂණය සඳහා පහසුකම් සලසා දීමටත් කටයුතු කළ යුතුය.

13.සැක කටයුතු කිතුල් රා සම්බන්ධයෙන් සුරාබදු පරීක්ෂකවරයකුට පහත් නොවූ නිලධාරියෙකු සාම්පල් ලබා ගෙන රස පරීක්ෂක වෙත යොමු කිරීමට හා එම වාර්තා අනුව බලපත්‍රධාරියාට විරුද්ධව ක්‍රියා කිරීමටත් හැකිය.

14.කිතුල් රා ප්‍රවාහන මාර්ගයේ කිතුල් රා විකිණිය නොහැක.

ඉහත කරුණු කියවා තේරුම් ගත් බවත් අදාළ සියලුම සුරාබදු දෙපාර්තමේන්තු කොන්දේසි හානි නීතිවලට එකඟ වන බවත් සහතික කරමි.

දිනය:-..... .....

බලපත්‍රධාරියාගේ අත්සන

.....

හැඳුනුම්පත් අංකය

.....

බලපත්‍ර අධිකාරී